# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1442/2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2023

දිනය / திகதி / Date – 18/11/2023 පැය 1140

### මාධ්‍ය නිවේදනය

**01. 2023.11.17 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 01 | 01 | 30 | - | තඹ දඟර 01 |

වැටලීම සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරු සහ දේපල දෙහිඕවිට පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2023.11.17 වන දින සවස් කාලයේ රාගම පොලිස් වසමේ කඩවත ප්‍රදේශයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත **හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 02 මිලි ග්‍රෑම් 280 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු** අත්අඩංගුවට ගෙන රාගම පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 56 ක් වූ කඩවත ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. රාගම පොලිසිය මගින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මන්නාරම කඳවුර.**

2023.11.17 වන දින සවස් කාලයේ මන්නාරම පොලිස් වසමේ පුදුකුඩිරිප්පු ප්‍රදේශයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා මන්නාරම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත **හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 02 මිලි ග්‍රෑම් 600 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු** අත්අඩංගුවට ගෙන මන්නාරම පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වූ තලෙයිමන්නාරම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. මන්නාරම පොලිසිය මගින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04.** **බලපත්‍ර නොමැතිව ටිපර් රථයකින් පස් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා හම්බන්තොට කඳවුර.**

2023.11.17 වන දින උදෑසන කාලයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා හම්බන්තොට කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත අම්බලන්තොට පොලිස් වසමේ අරවනමුල්ල ප්‍රදේශයේ දී වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව ටිපර් රථයක් මගින් පස් ප්‍රවාහනය කරමින් සිටි පුද්ගලයෙකු අත්අඩංගුවට** ගෙන අම්බලන්තොට පොලිසිය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වූ අම්බලන්තොට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. අම්බලන්තොට පොලිසිය මගින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05.** **විදේශීය රටක නිෂ්පාදිත දුම්වැටි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා තංගල්ල කඳවුර.**

2023.11.17 වන දින දහවල් කාලයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා තංගල්ල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මාතර පොලිස් වසමේ මාතර ප්‍රදේශයේ දී වැටලීමක් සිදුකර **විදේශීය රටක නිෂ්පාදිත දුම්වැටි 300 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන මාතර පොලිසිය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වන මාතර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. මාතර පොලිසිය මගින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06.** **ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුර.**

2023.11.17 වන දින දහවල් කාලයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත තණමල්විල පොලිස් වසමේ ඌරුහොර ප්‍රදේශයේ දී වැටලීමක් සිදුකර **ගංජා කිලෝ 03 ග්‍රෑම් 800 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන තණමල්විල පොලිසිය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 52 ක් වන ඌව කුඩාඔය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. තණමල්විල පොලිසිය මගින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07.** **කේරළ ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කිලිනොච්චිය කඳවුර.**

2023.11.17 වන දින සවස් කාලයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා කිලිනොච්චිය කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත කිලිනොච්චිය පොලිස් වසමේ තිරුනගර් ප්‍රදේශයේ දී වැටලීමක් සිදුකර කේරළ **ගංජා කිලෝ 01 ග්‍රෑම් 305 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන කිලිනොච්චිය පොලිසිය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වන කිලිනොච්චිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. කිලිනොච්චිය පොලිසිය මගින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08.** **බලපත්‍ර නොමැතිව මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා දඹුල්ල කඳවුර.**

2023.11.17 වන දින සවස් කාලයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා දඹුල්ල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ගල්කිරියාගම පොලිස් වසමේ කළුගල ප්‍රදේශයේ දී වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ආඩියාගල අඩවි වන කාර්යාලයේ අඩවි වන නිලධාරී වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වූ බඹරගස්වැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.